

# සිනුවර හසුන

**සිඩ්නි සිට ලියමි**

වයසට යත් ම අපේ කාර්යක්ෂමතාවය අඩුවේ. තව දුරටත් කිරීමට හැකියාව ඇති සෑම දෙයක්ම කළ හැකිවන්නේ තරුණ කාලයේ දී ට වඩා අඩු වේගයකිනි. ඇවිදීම, කතාව, කියවීම, අවබෝධය, ධාරණ ශක්තිය වැනි මෙකී නොකී සියළු දේම ටිකෙන් ටික මන්දගාමී වේ. කරුණු එසේ නමුදු, එක් දෙයක නම් වේගය අඩුවීමක් ඇත්තේ ම නැත. ඒ අන් කිසිවක් නොව කාලය ගත වෙන වේගයයි. ඇත්තටම කියනවා නම් කාලය ගතවීම  අපට දැනෙන වේගය යි. එහි වැඩි වීමක් මිස අඩු වීමක් නැත.

අළුත් වසර 2009 එළැඹුනේ අද ඊයේ මෙන් තවමත් දැනුනද, අද අප මේ ඉන්නේ වසරේ දෙවන මාසයේ ය. මේ මා ලියන සිනුවර හසුන කොළමේ හයවන කලාපයයි. කල් ගතවෙන ඉක්මන! නැවතත් කියනවා නම්, කාලය ඉතා වේගයෙන්, අප තරුණ කාලයේ දී සිදු වූවා ට වඩා ඉතා වැඩි වේගයකින් ගලා යයි. නමුත් මෙහි සැබෑ තේරුම නම්, අප තව තවත් වයසට යන වේගය ද වැඩි වී ඇති බව නොවේ ද?

මා කුඩා කාලයේ දී, මට ඉතා සුවිශේෂී ලෙස වසරක් ලෙස හැඟුණු වසර 2000 වන විට මා වයස අවුරුදු 37 ක "වයස්ගත" පුද්ගලයෙකු වන බව මෙනෙහි කර මා එදා දුක් වූවා මට තවමත් මතකය. නමුත් එදා වසර 2000 දී තිබූ "තරුණකම" අද වසර 2009 දී මට නැවත ලබා ගන්නට හැකි නම් එය මහත් භාග්‍යයක් වෙනු ඇත. ලොව අන් සියළු දේ සේම තරුණ මහළු යන්නද සාපේක්ෂ අර්ථ දැක්වීමකි.

ඒ කෙසේ වූවද, ටිකෙන් ටික ජීවිතයේ සන්ධ්‍යා භාගයට අප ලංවෙත්ම, සිරුරේ මෙන්ම ජීවිතයේ ද වෙනස් කම් කීපයක් ඇතිවේ. මින් ප්‍රධාන වෙනසක් නම් ආගම දහමට සිත නැඹුරු වීමයි. ලෝ වැඩ සඟරාවේ දැක්වෙන පරිදි "කොතැන උනත් නැත මරු හට බාද" නිසා, "අද අද එයි මරු පින් කර ගන්නේ" යැයි සිතමින්, "තම තම ඥාන පමණින් දැන ගත යුතු" ධර්මය ආශ්‍රය කරන්නට අප පෙළඹෙමු. නිතර පන්සල් යන්නෙමු. පෝය ට සිල් ගන්නෙමු. භාවනා කරන්නෙමු. මේ කරුණු ගැන සමාන උනන්දුවක් ඇති අය හමුවූ විට නිරතුරු සාකච්ඡා කරන්නෙමු. සමහර විට භාවනාව පිළිබඳ කෙරෙන මෙවැනි සාකච්ඡා සඳහා ඇත්තටම භාවනා කරනවාට වඩා වැඩි කාලයක් මිඩංගු කරන්නෙමු. එහි වරදක් නැත. මේ සියළුම දේ වල මූලික අරමුණ චිත්ත සන්තුෂ්ඨිය ම වන බැවිනි.

සිනුවර වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති බෞද්ධයින් ට ආගමික කටයුතු සඳහා මෙතෙක් ඇත්තේ එකම එක සම්ප්‍රදානුකූල "සිංහල" පන්සලක් පමණි. ඒ සිඩ්නි නගරයෙන් කිලෝ මීටර් 45 ක් පමණ වයඹ දිගින් පිහිටි ස්කෝෆීල්ඩ් හි ලංකාරාමයයි. මීට අමතරව සිනුවරින් කිලෝමීටර 100 ක් පමණ බටහිරින් කටුම්බා ප්‍රදේශයේ ද ආරණ්‍ය සේනාසනයක් පිහිටා ඇත.

මා අසා ඇති ඉතිහාසයට අනුව, වසර 1992 දී සිඩ්නි නුවර වාසය කරන ශ්‍රී ලාංකික බෞද්ධයින් ගේ ආධාර සහ උපකාර ඇතුව ලංකාරාම විහාරය ලිඩ්කොම්බ් හි කුලී නිවසක ආරම්භ කර, ඒ වසර අවසානයේ දී ඕබන් නගරයට ගෙන ගොස්, පසුව 1997 දී ස්කෝෆීල්ඩ් හි දැන් විහාරය පවත්වාගෙන යන ස්ථානයේ පිහිටුවා ගෙන ඇත. මේ වන විට ලංකාරාමය, චෛත්‍යය, බෝ මළුව, බුදු මැදුර සහ සංඝාවාසය ආදී වූ ප්‍රධාන විහාර අංගෝපාංගයන්ගෙන් සමන්විත බෞද්ධ මධ්‍යස්ථානයකි.

ඩොලර් තුන් ලක්ෂයකටත් වඩා වැඩි වියදමක් දරා, දිගු කාලයක් තිස්සේ ඉදිකිරීම් කටයුතු කර ගෙන ගොස්, 2006 නොවැම්බරයේ දී කොත් පළඳවා විවෘත කරන්නට යෙදුණු ලංකාරාම චෛත්‍යය ගැන ද මෙහි විශේෂයෙන් සඳහන් කළ යුතු ය. කළුතර බෝධි සෑය සිහිගන්වන මෙම චෛත්‍යයේ සැකිල්ල කුහරාකාර වන අතර සමාධි පිළිමයකින් යුතු බුදු මැදුර පිහිටා ඇත්තේ චෛත්‍යය මධ්‍යයේය. පන්සලේ දී වන්දනා මාන කළ යුත්තේ චෛත්‍යය, බෝධිය, බුදු මැදුර යන අනු පිළිවෙලට නිසා, එය අනුගමනය කරන සැදැහැවතුන් ට චෛත්‍යය මළුවට දෙවරක් පිවිසීමට මෙනිසා වරම් ලැබේ.

සිනුවර තදාසන්න ප්‍රදේශ වල වෙසෙන සිංහල බෞද්ධයින් සියළු දෙනාටම ඇත්තේ මේ එකම පන්සල බැවින් පෝය දින වලට පන්සල සැදැහවතුන්ගෙන් පිරී ඉතිරී යයි. දැන් ලංකාරාමයට ඇති ලොකුම අවශ්‍යතාවය දැනට ඇති තාවකාලික ශාලාව වෙනුවට වැඩි පිරිසකට රැස්විය හැකි ධර්ම ශාලාවකි. ඩොලර් මිලියනයක පමණ වියදමක් ඇස්තමේන්තු ගත ධර්ම ශාලාව ගොඩ නැගීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු මේ දිනවල ඇරඹී ඇත.

සිනුවර තදාසන්නයේ ඇති එකම "සිංහල" පන්සල වන ලංකාරාමය ගැන කතා කරන විට මට සිහිවන්නේ මෙල්බර්න් නුවර තදාසන්නයේ පිහිටා ඇති "සිංහල" පන්සල් ප්‍රමාණයයි.  සිනුවර සගයින් ගේ දැන ගැනීම පිණිස කෙටියෙන් කියතොත්, මා 1995 දී මෙල්බර්න් නගරයට පැමිණෙන විට ඩැංඩිනොං, නෝබල් පාර්ක් සහ ස්ප්‍රිංවේල් නගරවල "සිංහල" පන්සල් ඉදිවී තිබු අතර මෝල්වන් හි සමහර කාලයන් හි සිංහල හාමුදුරුවන් වැඩ ඉන්නා ජාත්‍යන්තර පන්සලක් ද තිබුණි. අනතුරුව යුරෝක් හි පන්සලක් ගොඩ නැගුණු අතර මගේ මතකයට අනුව සිංහල ප්‍රජාවේ ව්‍යාප්තිය නිසා පෙර කී පන්සල් දෙකක් කීස්බරෝ සහ බෙරික් ප්‍රදේශවලට ගෙන යාමට සැලසුම් කෙරිණි. මීට අමතරව රිංග්වුඩ් හි සිංහල හාමුදුරුනමක් ද මෙහෙණින් වහන්සේ ලා ද වැඩ ඉන්නා ජාත්‍යන්තර පන්සලක් බිහිවුණු අතර මා මෙල්බර්න් නුවරින් සිනුවරට සංක්‍රමණය වූ 2002 වන විට මෙල්බර්න් හි උතුරු ප්‍රදේශයේ ද "සිංහල" පන්සලක් ගොඩ නැගීමට අදහස්  කර තිබුණි. එදා තත්වය අද තව තවත් වැඩි දියුණු වී ඇති බවට සැක නැත.
මේ අනුව බලන කළ මෙල්බර්න් පුරවරය අද ඕස්ට්‍රේලියාවේ සිංහල බෞද්ධ කේන්ද්‍රස්ථානයයි. සිනුවර එහි අහලක වත් නැත.

පන්සල් ගණන වැඩිවත්ම, ඒ අනුපාතයටම නොවුනත්, ප්‍රජාවේ ආගමික හැදියාව වැඩිවේ. එය නිසැකවම හොඳ දෙයක් බව අමුතුවෙන් කිව යුතු නැත. එකම ප්‍රශ්ණය නම් සම්පත් බෙදී යාමයි. එයද කෙටි කාලීන ප්‍රශ්ණයක් පමණකි.
සිනුවර තදාසන්නයේ තවත් "සිංහල" පන්සල් බිහි වේවා යැයි සාසනාලයෙන් යුතුව පතමි.

ලබන මාසයේ නැවත හමුවෙමු.

**සිනුවර ආරච්චිල**

<sinuwara.arachchila@gmail.com>

**සමහර විට ගෙදර ඉන්න ලොකුම බබා වෙන්න බලන්නෙ සැමියා. ඒ වගේම උදේ නැගිටලා බිරිඳගෙන් තේ එක හදලා රැකියාවට යන මහත්තුරු ගෙදර ආවමත් කිසි මැසිවිල්ලක් නැතිව ගෙදර දොර වැඩ පළටත් උපරිම සහය දෙනවා මගෙ ඇස් දෙකට මං දැකලා තියෙනවා. එහෙම බිරින්දෑවරු වාසනාවන්තයි. නමුත් ඒ සහයෝගය අගය කරනවා වෙනුවට ඔවුන් හිතනවා එය ඔහුගෙන් ඉටුවිය යුතු යුතුකම කියලා. ඒත් ඒ අදහස නිවැරදී කියලා පිළිගන්න බෑ. මෙල්බර්න් ආව වෙලාවෙ සාදයකදි මුණ ගැහුණ යෙහෙළියන් පිරිසක් ගෙදර දොර වැඩ කටයුතු ගැන කතා කරද්දි එක්කෙනෙක් කිව්වෙ 'ගෑණු වැඩ කරන තරමට අත් දෙක ගෙවෙනවා නං දැන් මගේ අත් දෙක තියෙන්නෙ මෙන්න මෙතන' කියලයි. ඇය පෙන්නුවේ ඇගේ උරහිස.**



# අප ම සොයාගත යුතු My Time

'මේනකා මැරී කරලා නෑලු නේද? ' දවසක් කාර්යාලයට යන අතරෙදි දුම්රියේ හමුවුණු යෙහෙළියක් ඇහුවා.

'තාම නෑ' මගෙ උත්තරය සරලයි.

'තාම නෑ කිව්වෙ එහෙනං ළමයා බඳින අදහසකුත් තියෙනවා.'

'අනේ ඔව් තව මාස තුනකින් විතර' එදා මං එහෙම පිළිතුරු දුන්නා.

'ඔයත් එහෙනං අමාරුවෙ වැටෙන්නයි යන්නෙ' නොකිව යුත්තක් කියවුණා වගේ ඇය මා දිහා බැලුවා.

'ඇයි ඒ ?'

'නෑ ඉතින් බැඳපු නැති අය බඳින්න හිතනවා, බැඳපු අය කර ගත්ත අපරාදයක් කියලා හිතනවා.'

'ඒක හරි සම්ප්‍රදායික උත්තරයක් නෙ, ඔයත් එහෙම හිතනවද ?'

මං එහෙම ඇහුවෙ ඇගේ හඬ වෙනස් වුණු ස්වරය මට දැනුණ හින්දා.

'හම්.... වෙලාවකට එහෙමත් හිතෙනවා, නෑ ඉතින් මං කියන්නෙ ඒ කාලෙ බඳින්න කලින් තිබුණ නිදහස බැන්දට පස්සෙ නෑනේ.'

'අහුවට නමක් නැද්ද මන්දා, ඇයි ඔයා එහෙම කියන්නෙ, මොන පැත්තෙන්ද නිදහස ඔයාට නැතිවුණේ.' මං ඇහුවම ඈ හිනා වුණා.

'පත්තරේට දාන්න හොඳ මාතෘකාව නේද ?' මං හිතුවෙ කතාව වෙනස් කරන්න හදනවා කියලයි.

'බොරුද බලන්න මං කියන්නෙ උදෙ නැගිටලා තේ හදන වෙලාවෙ ඉඳලා රෑ නින්දට යනකල්ම ගෑණු අපිට වැඩ වැඩ සහ තවත් වැඩනෙ. මමනං දවසෙම යන්තරයක් වගෙයි. දරුවො දෙන්නගෙ, මහත්තයගෙ වැඩ, ගෙදර වැඩ. මේ ඔක්කොම මැද ඔෆිස් එකටත් යන්නෙ අන්තිම මොහොතෙ. හුඟක් දවස්වලට කෝච්චියත් වරදිනවා. ලංකාවෙ වගෙ මෙහෙත් රතු ඉරි සෙල්ලම තිබුණානං මට රතු ඉරි ගහන්න සුමානෙකට රතු පෑන ගානෙ ඕන වෙනවා. ඔයා දන්නවද ? සුමානෙකට දවස් තුනක් විතර මං වැඩට යද්දි අනික අය වැඩ පටන් අරගෙනත් ඉවරයි.' ඇය දිග කතාවක් කිව්වා කිසිම නැවතීමක්, කොමාවක් නැතිව.

'මහත්තයාගෙ සහයෝගයක් නෑ ?' මං ඇහුවෙ කතාව දිගට ගෙනියන්න.

'අනේ වැඩක් නෑ, එයා තමයි මට ඉන්න ලොකුම බබා. කිසි දෙයක් තනියෙන් කරගන්න බෑ, ඔයාටත් ඉස්සරහට ඒවා තේරෙයි' මටත් අනතුරු අඟවමින් ඇය දුම්රියේ දොරටුව ළඟටම කිට්ටු වුණේ ඇගේ ගමනාන්තය එය වූ නිසා.

ඇත්තටම අපේ විවාහක කාන්තාවන්ට තමන්ට කියලා වෙලාවක් නැද්ද ? සමහර විට මට හමුවෙන, සමහරවිට මාත්තෙක්ක කතා කරන අයගෙන් මම 'මයි ටයිම්' ගැන ඇහුවා, හුඟක් වෙලා උත්තරය එකයි.

'මොන මයි ටයිම්ද ? ඒවා බඳින්න කලින්, අපි ගෙදර ඉන්න කාලෙ, අම්මලා ඉතින් අතට පයට හැමදේම කරලා දුන්නට ඒ කාලෙ උදේ ඉඳලා රෑ වෙනකල් පැය 24ම මයි ටයිම් තමයි'

මං හිතන්නෙ අපිට අපි ගැන බලන්න වෙලාවක් කවුරුවත් හොයලා දෙන්නෙ නෑ. ඒක අපිම සොයා ගත යුතුයි. එහෙ කියලා ගෙදර දොරේ වැඩ ටික අතපසු කරල තමන්ගෙ වැඩ ටික කරගන්න කියනවා නෙවෙයි. ගෙදරක්, ගෙදරක් විදියට තියා ගන්න අපි දවස ක්‍රමානුකූලව සැලසුම් කර ගන්නවා නම් අපිට අපි ගැන බලන්නත් කාලයක් ඉතුරු කර ගන්න හිතන තරම් බරපතල කාරණා නෙවෙයි.

පවුලේ අය එකිනෙකා කෙරෙහි දක්වන සහයෝග යට ඒ වෙනුවෙන් හුඟක් දේ කරන්න පිළිවන්. ලොකු සහයෝග නැතත් ගෙදර ඉන්න හැමෝගෙන්ම ලැබෙන පුංචි සහයෝගයත් කාල වේලාව ඉතිරි කර ගන්න හුඟක් වටිනවා. දරුවො උදේ නැගිට්ද්දි තමන් නිදා ගත්ත කොට්ටය පොරෝනාව නිසි පිළිවෙලට තියලා කාමරෙන් එළියට එන්න දරුවන්ට කියලා දුන්නා නම් වැඩ කරන අතරෙ කාමර අස්කරන්න ඕන වෙන්නෙ නෑ. කිළිටි රෙදි ටික ගලවන ගමන්ම ඒ නියමිත රෙදි කූඩයට දාන්න දරුවන්ට කියලා දෙනවා වගේම සැමියාත්, ඔබත් ඒ පිළිවෙත අනුගමනය කරනවානම් රෙදි සෝදන වෙලාවට ගේ වටේ දුවමින් කිළිටි රෙදි එකතු කරන කාලය ඉතිරි කර ගන්න පුළුවන්. උයන පිහන වෙලාවට 'මගේ එක වැඩේ දෙක කරන් නැතිව අන්න අරෙහෙට වෙලා ඉන්න' කියලා දරුවන්ට තරවටු කරනවට වඩා එයාලගෙන් ලැබෙන පුංචි සහයෝගයත් වටිනාකමක් දෙන්න පුළුවනි නම් උයන එක විඩාවක් වෙන්නෙ නෑ. ඒ හැමකෙනෙක්ගෙ න්ම සහයෝගයක් ලැබෙනකල් නොසිට සහයෝගය ලබා දෙන තැනට ඔබ උපායශීලී වෙන්න පුළුවන්.

ඇත්ත සමහර විට ගෙදර ඉන්න ලොකුම බබා වෙන්න බලන්නෙ සැමියා. ඒ වගේම උදේ නැගිටලා බිරිඳගෙන් තේ එක හදලා රැකියාවට යන මහත්තුරු ගෙදර ආවමත් කිසි මැසිවිල්ලක් නැතිව ගෙදර දොර වැඩ පළටත් උපරිම සහය දෙනවා මගෙ ඇස් දෙකට මං දැකලා තියෙනවා. එහෙම බිරින්දෑවරු වාසනාවන්තයි. නමුත් ඒ සහයෝගය අගය කරනවා වෙනුවට ඔවුන් හිතනවා එය ඔහුගෙන් ඉටුවිය යුතු යුතුකම කියලා. ඒත් ඒ අදහස නිවැරදී කියලා පිළිගන්න බෑ. මෙල්බර්න් ආව වෙලාවෙ සාදයකදි මුණ ගැහුණ යෙහෙළියන් පිරිසක් ගෙදර දොර වැඩ කටයුතු ගැන කතා කරද්දි එක්කෙනෙක් කිව්වෙ 'ගෑණු වැඩ කරන තරමට අත් දෙක ගෙවෙනවා නං දැන් මගේ අත් දෙක තියෙන්නෙ මෙන්න මෙතන' කියලයි. ඇය පෙන්නුවේ ඇගේ උරහිස. නමුත් මොන තරම් වැඩ කරත් ඔවුන් සතියකට දෙකකට සැරයක් විනෝද වෙන්න අවස්ථාවකුත් ලබා ගන්න එක වටිනවා.

දවස ක්‍රමානුකූලව සකසා ගන්නවා නම්, අපි භාවිතා කරන හැම දෙයකටම නිසි තැනක්, නිසි පිළිවෙලක් තියෙනවා නං, පුංචි වැඩක් වුණත් විහිළුවෙන් මග අරින ගෙදර ඇත්තන්ව උපායශීලීව ආදරෙන් ඒ වැඩ කටයුතු වලට නම්මවා ගන්න පුළුවනි නං මං හිතන්නෙ ගෙදරක ගෘහණියකට තමන්ටය කියලා මැහුමක් ගෙතුමක් කරගන්න, විනෝදයකට යොමුවෙන්න කාල වේලාවක් හොයා ගන්න එක අපහසු වෙන එකක් නෑ.

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය